““

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2487/08 – 2026 මැයි මස 05 වැනි අඟහරුවාදා – 2026.05.05**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**1974 අංක 442 දරන ආඥාව**

මගේ අංකය: J/62/63/L/68/VE.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 2/5/බී/5/38.

අංක 442 හා 1974.08.23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* භාෂාත්‍රයෙන් පළකරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානය යටතේ ආඥාවේ II වන ඡේදයේ සඳහන් ඉඩමේ විස්තරයෙහි, “අංක නු. 234 දරන මූලික පිඹුරේ අංක 1 සහ 3 දරන ඉඩම් කැබලි දෙක,” යන්න වෙනුවට “අංක නු. 234 දරන මූලික පිඹුරේ අංක 1 සහ 2 දරන ඉඩම් කැබලි දෙක,” ලෙස නිවැරදි විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

2026 මාර්තු මස 09 වැනි දින.
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
“මිහිකත මැඳුර”,
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 05 – 0002

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2026 අංක 28 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/18/2021/WS/387.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: RUW/LAN/ACQTN/A2/269.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම පහත සඳහන් උපලේඛනයේ I වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට *නැතහොත්,* එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ II වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

2026 පෙබරවාරි මස 12 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
“මිහිකත මැඳුර”, අංක 1200/6,
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

**උපලේඛනය**

I. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, රුවන්වැල්ල.

II. **ඉඩමේ විස්තරය.–** සබරගමු පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 109 කන්නන්තොට ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කන්නන්තොට ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක KE/RWN/2024/115 හා 2024.12.31 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – කන්නන්තොටවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0588**

උතුරට: මු.පි.කෑ. 639 හි කැබලි අංක 45 සහ 15; නැගෙනහිරට: මු.පි.කෑ. 639 හි කැබලි අංක 15; දකුණට: මු.පි.කෑ. 639 හි කැබලි අංක 15, මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ මු.පි.කෑ. 639 හි කැබලි අංක 45; බටහිරට: මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ මු.පි.කෑ. 639 හි කැබලි අංක 45.

02. **කැබලි අක්ෂර 'B' – කන්නන්තොටවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0019**

උතුරට: මු.පි.කෑ. 639 හි කැබලි අංක 15 සහ මාර්ගය; නැගෙනහිරට: මාර්ගය; දකුණට: මාර්ගය සහ මු.පි.කෑ. 639 හි කැබලි අංක 15; බටහිරට: මු.පි.කෑ. 639 හි කැබලි අංක 45.

EOG 05 – 0006

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.